# ගෝලීය සමාජය අවබෝධ කරගැනීමේ ක්‍රමවේදී ගැටළු

ආචාර්ය ටියුඩර් වීරසිංහ,

අධ්‍යයන ජනමාධ්‍ය තුළ ගෝලීය සමාජය (ගෝලීයකරණය) පිළිබඳ විවිධ අදහස් හා මත පළ වන නමුත් ඒවා සියල්ලම වාගේ ගෝලීය සමාජයේ විවිධ පැතිකඩ සම්බන්ධ ව සාමාන්‍ය චිත්තය තුළ ඉදිරිපත් කරන අදහස් ය. ගෝලීය සමාජයේ සියලුම අංශ නියෝජනය වන්නා වූ සමස්ත විද්‍යාත්මක විශ්ලේෂණ දක්නට නොලැබේ. ගෝලීය සමාජය කෙසේ වුව ද පොදුවේ සමාජය පිළිබඳවත් එවැනි විශ්ලේෂණයක් බටහිර සමාජ විද්‍යාව තුළ දක්නට නොලැබේ. බටහිර සමාජ විද්‍යාව පොදුවේ සමාජය පිළිබඳව මතවාදයක් ලෙස හැඳින්වීම වඩාත් යෝග්‍ය වන්නේය. බටහිර ලිබරල්වාදී, ප්‍රජාතන්ත්‍රවාදී, ධනවාදී, එසේම මාක්ස්වාදී, සංකල්ප සමාජය පිළිබඳ විද්‍යාත්මක විග්‍රහයන් ලෙස සැලකිය නොහැකිය. මෙය ගෝලීය සමාජයට අදාළව කතා කරන විට ගැටළුව තවත් සංකීර්ණ වන්නේය.

පවතින ජනප්‍රිය මතවාදවලට ප්‍රතිපක්ෂව ගෝලීය සමාජය අවබෝධකර ගැනීම සඳහා විද්‍යාත්මක ප්‍රවේශයක හා ක්‍රමවේදයක අවශ්‍යතාව කාලීන අවශ්‍යතාවයකි.

දෙවන ලෝක යුද්ධයෙන් පසුව අද අප ජීවත් වන ගෝලීය සමාජයේ මූලික ස්වරූපය සකස් වූ අතර, නමුත් එය පිළිබඳ විවිධ සංකල්ප මතු වන්නට වූයේ 1960 දශකයේ සිටය. එම සංකල්පීයකරණය තුළ ගෝලීයකරණය හෝ ගෝලීය සමාජය බලව්‍යුහයක්, පද්ධතියක්, තත්ත්වයක්, යුගයක් හා ක්‍රියාවලියක් ආදී වශයෙන් තේරුම් ගැනීමට ප්‍රයත්න දරූ බව පෙනේ.*

* Anthony Giddens. The consequences of modernity, 1990 Fredric Jameson and Masao Miyoshi (eds) The cultural of Globalization, 1998, Martin Albrow. The Global Age. 1997.



යම්ප්‍රදායික, දේශපාලනික, ආර්ථික, සංස්කෘත හා භූගෝලීය සීමා අතික්‍රමනය කරමින් මානව සමාජ පැවැත්මේ නව හා බහුවිධ අන්තර්ක්‍රියාකාරකම් වර්ධනය වීම ගෝලීයකරණය වශයෙන් හඳුනාගත හැකිය. එසේම ගෝලීයකරණය යනු සමාජ ක්‍රියාකාරකම් හා අන්තර්පර්යාන්ත සබඳතාවන් ප්‍රසාරණය වීම හා විහිදීයාමකි. මීට අමතරව ගෝලීයකරණය වශයෙන් තවත් සමහරු අදහස් කරන්නේ සමාජ හුවමාරු හා ක්‍රියාකාරකම් වේගවත්වීම හා තියුණුවීමකි.**

ගෝලීය සමාජයේ ස්වභාවය පිළිබඳ ඉහත ගෙන හැර දක්වන ලද බටහිර අර්ථ කථනයන් ගෝලීය සමාජයේ නියම ස්වභාවය එහි ව්‍යුහය හා ක්‍රියාකාරිත්වය පිළිබඳ නොමග යවන සුළු ආකල්පයක් ඇති කරනු ලැබේ. අප ඉහත ගෙන හැර දක්වන ලද අර්ථ කථන ගෝලීය සමාජය පිළිබඳ මතුපිටින් පෙනෙන ලක්ෂණ වන අතර ඒවා මගින් එම සමාජයේ ගැඹුර හා යථාර්ථය පිළිබඳ අවබෝධයක් අපට ලබා නොදෙයි.

ගෝලීය සමාජයට අනෙකුත් සියලුම සමාජවලට මෙන්ම නිශ්චිත පැවැත්මක් ඇත. එසේම එය අනුභූතික පැවැත්මක් වන අතර ඊට ආවේණික වූ සංවිධාන ව්‍යුහයක්ද තිබේ. ගෝලීය සමාජය නිශ්චිත කාල - අවකාශ පරාසයක් තුළ බිහි වී පරිණාමය වූවකි. ගෝලීය සමාජයට තමාගේ ම ඉතිහාසයක් තිබේ.

සැමටම කලින් ගෝලීය සමාජය විශාල අනුභූතික පද්ධතියක විශේෂ අවස්ථාවක් වශයෙන් සලකා බැලිය යුතුය. එය ඒකීය සමස්තයක් ලෙස විග්‍රහ කිරීමට නම් ගෝලීය සමාජය පද්ධතියක් වශයෙන් විශ්ලේෂණය කළ යුතුවේ. මෙහිදී මෙම ප්‍රවේශයේ හා ක්‍රමවේදයේ මූලික තත්ත්වයන් කෙරෙහි අපගේ අවධානය යොමු විය යුතුය.

ඕනෑම අනුභූති පද්ධතියක් යනු නිශ්චිත කාල - අවකාශ රාමුවක් තුළ ප්‍රාථමික සංඝටක විශාල සංඛ්‍යාවක ඒකරාශිවීමකි. අදාළ පද්ධතිය තුළ තිබෙන ප්‍රාථමික සංඝටක තව දුරටත් නොබෙදිය හැකි සේ

** Patrick O'Meara, Howard D. Mehlinger, and Matthew Krain (eds) Globalization and the challenges of the New Century 2000.

සැලකිය යුතුය. ප්‍රාථමික සංඝටක පැවතිමින්, ප්‍රතිනිෂ්පාදනය වෙමින් පද්ධතියේ යම් යම් අවශ්‍යතා ඉටු කරන අතර ඒවා සැලකිය යුතු දීර්ඝ කාලයක් පවතියි. එසේ නොවී ප්‍රාථමික සංඝටකවලට අදාළ පද්ධතිය කොටස් බවට පත් විය නොහැකිය. මේ තත්ත්වය තුළ ප්‍රාථමික සංඝටක බහුවිධ හා විවිධාකාර සම්බන්ධතාවලට එළඹේ. මේ හේතුව නිසා අදාළ පද්ධතිය තුළ ක්‍රියාකාරී ප්‍රාථමික සංඝටක මධ්‍යස්ථීකරණයකට ලක් වේ. මෙය සංඝටකයන් එකට ගැටීම හා බහුජනීකරණයේ අනිවාර්ය ප්‍රතිඵලයකි.

මානව සමාජය පද්ධතියක් ලෙස ගෙන විශ්ලේෂණය කිරීමේ දී ඉහත තත්ත්වයම එහි ද නිරීක්ෂණය කළ හැකිය. පුද්ගලයා මත බහුජන සමාජය බලපාන්නේ ද මේ ආකාරයටමය. මෙය ස්වභාවික නියමයකි. කිසිම සමාජයකට මින් විනිර්මුක්තව පැවතිය නොහැකිය. සමාජ ජීවිතය ඉතා සූක්ෂම ලෙස සැලසුම් ගත කළ ද, ඉතා උසස් සවිඥානික මට්ටමක් පැවතිය ද, මෙම නියමයට යටත් නොවී පැවතිය නොහැකිය. ගෝලීය සමාජයේ යථාර්ථය ද අනාවරණය කර ගත හැකිත් ඉහත දැක්වූ න්‍යායික ප්‍රවේශය හරහා බව අපගේ අදහසයි.

මේ අනුව ඒකීය මානව සමාජයක් පැවැතිය හා ක්‍රියාත්මක විය හැක්කේ රටවල් හා ජාතීන් අතර සමාන අයිතිවාසිකම් පදනමකින් යුත් සාමකාමී සහජීවනය මත නොව රටවල හා ජාතීන්ගෙන් ධූරාවලිගත සමස්ත සමාජ ව්‍යුහියකරණයක් තුළය. එම සමාජය තුළ පාලක හා පාලිත කණ්ඩායම් අතර සම්බන්ධතා ආධිපත්‍ය දරනු ලැබේ. එනම් සංස්කෘතික, ආර්ථික හා සමාජීය සම්බන්ධතාවල අසමාන තත්ත්වයක් පවතියි. මෙය මෙසේ සිදුවන්නේ යම් කිසි වාර්ගික හෝ ජීව විද්‍යාත්මක හේතූන් නිසා නොව විශාල බහු ජනතාවන් සංවිධානය වීමේ විෂය මූලික සමාජීය නියමයන් ක්‍රියාත්මක වීම නිසාය. එම විෂය මූලික සමාජීය නියමයන් දැන ගැනීම යන්නෙන් යටත් වීම අදහස් නොවේ. මිනිසුන් අතීතයේදී ත්, වර්තමානයේදී ත්, අනාගතයේදී ත් වෙනත් මිනිසුන්ගේ ආධිපත්‍යයට එරෙහිව අරගල කරනු ඇත. මෙහිදී සමානාත්මතාව පිළිබඳ අදහස් හා සදාචාරාත්මක අසාධාරණ බව යම් කාර්යභාරයක් ඉටු කරනු ඇත. නමුත් මානව සංහතිය සිරස්



අතට ව්‍යුහගත වීම නොවැළැක්විය හැකි විෂය මූලික ප්‍රවණතාවකි. මේ අනුව ලෝකයේ සියලුම රටවල් හා ජාතීන් ගෝලීය සමාජය තුළ සිරස් දිශාවට ව්‍යුහගත වීම අනිවාර්ය සමාජ නියමයකි. ඕනෑම මානව ඒකාබද්ධතාවක් තුළ ක්‍රියාත්මක වන සාමූහික නියමයන් විවිධ ජාතීන්ගෙන් (ජනතාවන්ගෙන්) සංයුක්ත ඒකීය මානව සංහතිය තුළද ක්‍රියාත්මක වේ. විවෘතව හෝ සංවෘතව ලෝකාධිපත්‍ය සඳහා වූ ප්‍රයත්නය මානව සංහතිය ඒකීය සමස්තයක් වශයෙන් ඒකාබද්ධ කිරීමෙ ප්‍රවණතාව තුළ සංයුක්තව පවතියි.

ගෝලීය සමජයේ ස්වභාවය අවබෝධ කර ගැනීමෙදී අපගේ අවධානය මූලික වශයෙන් යොමු විය යුත්තේ ලෝක සමාජය කලාප වශයෙන් බෙදීම කෙරෙහි නොව එහි සිරස් ව්‍යුහගත වීම පිළිබඳවය. එක් ධූරාවලි රේඛාවක් ඔස්සේ පමණක් මෙය සිදුවෙන බව සිතීම අපහසුය. මෙය එවැනි ධූරාවලි විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක වන අතර ඒකීය ලෝක ධූරාවලි රේඛාවක් පැවැතිය හැක්කේ තිර, ස්ථාවර පැවැත්ම ලෙස නොව ප්‍රවණතාවක් වශයෙනි. ලෝක ධූරාවලියේ ඉහළින් ම බටහිර රටවල් පවතින බව පැහැදිලිය. නමුත් එම රටවල් ද ස්වකීය ව්‍යුහයක් දරන්නේය. එක් අතකින් ඇමරිකා එක්සත් ජනපදයේ නායකත්වය යටතේ ඇමරිකානු කලාපය ද අනෙක් අතින් යුරෝපා කලාපයද ලෝක ධූරාවලියේ ඉහළින් පවතී. ලෝක සමාජයට මෙ සෑම කෙනෙක්ම සිය අඬු දිගු කරන්නේය. බටහිර රටවල්ම බොහෝ මානයන් ඔස්සේ ධූරාවලිගත වී තිබේ. සෙසු රටවල තමන්ට ම ආවේණික වූ ව්‍යුහියකරණයකට ලක් වී ඇත. විවිධ රටවල මානව ස්තර තමන්ටම නෛසර්ගික වූ ආකාරයකට ලෝක ස්ථරයක් නිර්මාණය කරන්නේය. නිදර්ශනයක් වශයෙන් ව්‍යාපාරික, දේශපාලනික හා සංස්කෘතික සංවිධානාත්මකව ස්වයංසිද්ධව ව්‍යුහගත වන්නේය.

මේ අනුව ලෝක සමාජය යනු බහුවිධ ධූරාවලී ව්‍යුහයකි. ඒවා සියල්ල ම එකිනෙක ගැටෙමින්, සංකලනය වෙමින් සමස්තයක් වශයෙන් ඒකීය ව්‍යුහයක් නිර්මාණය කිරීම කෙරෙහි යොමු වී ඇත. මේ අප කතා කලේ විවිධ රටවල් හා ජාතීන් විශාල සංඛ්‍යාවක් ඒකීය සමස්තයක් වශයෙන් සංවිධානය විය හැකි එක් ආකාරයකි.

මීට අමතරව සිරස් ව්‍යුහගත වීම වෙනස් ආකාරයකට ද සිදු විය හැකිය. එනම් දැනට පවතින ව්‍යුහ මත නව සමාජ මට්ටම්, තල නිර්මාණය වීම තුළින් ද ලෝක සමාජය ඒකීය ගෝලීය සමාජයක් ලෙස සංවිධානය විය හැකිය. මෙම නව හෙවත් ද්විතියික සමාජ ඒකාබද්ධ වීම සුවිශාල මිනිසුන් සංඛ්‍යාවකින් ගොඩනැගෙන අතර ඒවායේ ක්‍රියාකාරිත්වයට එක් රටක් පමණක් නොව රටවල් විශාල සංඛ්‍යාවක් හසු විය හැකිය. දැනටමත් මේ ආකාරයේ සංවිධාන ව්‍යුහ නිර්මාණය වී තිබේ.

වෙළඳ සංවිධාන, වානිජ නොවන සංවිධාන හා වෙනත් ආයතන දසදහස් ගණනක් දැනටමත් පවතින අතර ඒවායේ පෝෂක හා ක්‍රියාකාරී ප්‍රදේශ ලෙස ලෝකයේ විවිධ කලාප, විවිධ ජන කණ්ඩායම් පමණක් නොව ප්‍රයෝගිකව මුළු පෘථිවි තලයටම හසු වී තිබේ. එම ගෝලීය සංවිධානවල ක්‍රියාකාරිත්වය නිශ්චිත රාජ්‍යවල හා ආණ්ඩුවල දේශපාලනය මත තීරණය නොවේ.

මේ ආකාරයේ ද්විතියික සංවිධාන විශාල සංඛ්‍යාවක් ජාතික රාජ්‍යයන්ට සම්බන්ධව හා ජාතික රාජ්‍යයන් පාදක කොට ගෙන හැඩගැසේ. සමස්තයක් ලෙස එම සංවිධාන මගින් සංකීර්ණ හා බහු රේඛීය දැලක් මෙන් පද්ධතියක් නිර්මාණය වේ. මෙම සංකීර්ණ පද්ධතිය වටා බටහිර හා වෙනත් රටවල් එකට වෙළී පවතින අතර එය මෙම රටවල් තුළට විවිධ පැතිකඩවල් හරහා විනිවිද යමින් සිය ක්‍රියාකාරිත්වයේ ක්ෂේත්‍රයන් වශයෙන් ප්‍රයෝජනයට යොදා ගනී.

මෙම පද්ධතිමය ව්‍යුහය තුළ කිසිම රටකට ගෝලීය සමාජයේ හාම්පුතා බවට පත්වීමට හැකියාවක් නැත. මක්නිසාද යත් මේ වැනි ව්‍යුහයක් තුළ එවැනි හාම්පුතෙකුට ඉටු කිරීම සඳහා කිසිම කාර්ය භාරයක් නැති නිසාය. අතීතයේදී යුරෝපීය රටවල් පෙරදිග රටවල පවත්වා ගෙන ගිය ආධිපත්‍ය නායකත්වය මෙන් නායකත්වයක් කිසිම රටකට ගෝලීය සමාජයේ ක්‍රීටය බවට පත් විය නොහැකිය. මෙම ගෝලීය පද්ධතිය තුළ බටහිර රටවලට ප්‍රමුඛ ස්ථාවරයක් අත් වන නමුත් පද්ධතියේ උසස් මට්ටමේ පැවැත්ම සඳහා එම රටවල් ක්‍රියාකාරී කලාපයක් බවට පත්විය යුතුය.



ගෝලීය සමාජය අවබෝධ කර ගැනීම සඳහා ප්‍රවේශයක්, ක්‍රමවේදයක් ලෙස අප මේ ඉදිරිපත් කළ අදහස වැදගත් වනු ඇත. විශේෂයෙන් අද්‍යතනයේ මානව සමාජය පිළිබඳ විද්‍යාවන් තියුණු මතවාදීකරණයට ලක්ව ඇති තත්ත්වයක මෙවැනි ප්‍රවේශයක ඇති වැදගත්කම හා අගය තවත් ඉහළ යනු ඇත.

ගෝලීය සමාජය පිළිබඳව අප මේ ඉදිරිපත් කරන විග්‍රහයේ දී වඩාත් වැදගත් වන්නේ මෙ හෝ ඒ දේ පිළිබඳව දැනුමට වඩා අදාළ දේ වටහා ගැනීමයි.

විශේෂයෙන් මානව සමාජය වැනි සංකීර්ණ පද්ධතියක් අවබෝධ කර ගැනීම ස්වයංක්‍රීයව සිදු නොවන්නකි. ඕනෑම සමාජයක දස ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් තමන් ජීවත්වන සමාජය පිළිබඳ අවබෝධයක් නොමැතිව ජීවත් වනවා පමණක් නොව එය අවබෝධ කර ගැනීමට කිසිම ප්‍රයත්නයක් වත් නොදරාම මිය යන්නේය. දස ලක්ෂ සංඛ්‍යාත මිනිසුන් සමාජයේ ජීවත් වීමට ඉගෙන ගනිමින් සිටිති. නමුත් මිනිසුන්ට සමාජයේ ජීවත් වීම සඳහා හැකියාවක් ලබා ගැනීම හා එය අවබෝධ කර ගැනීම අතර සමපාත බවක් නැත. එනම් සාමාන්‍ය සමාජ ජීවිතයේ දී මිනිසාට වඩාත්ම වැදගත් වන්නේ දැනුම මිස අවබෝධය නොවේ. සමාජය ප්‍රපංචයන් අවබෝධ කර ගැනීමට උත්සාහ දැරීම සාමාන්‍ය ජීවන සටන ගෙන යාමට බාධාවකි.

මානව සමාජය බොහෝ දුරට ජීව දේහයකට සමාන නමුත් එය එයටම ඌනනය කළ නොහැකිය. මානව සමාජය සමාජීය දේහයක් ලෙස ජීව දේහයන් ගෙන් බොහෝ දුරට වෙනස් වේ. මානව සමාජය බහු රේඛීය හා සංකීර්ණ ස්වභාවයක් දරන අතර එය නිර්මාණය වී ඇති සංඝටකයන් ජීව දේහයක මෙන් පැහැදිලි ස්වරූපයක් නොගනී. මානව සමාජයේ විවිධ අංග අතර සීමා අවිනිශ්චිත හා ගතික මෙන්ම නම්‍යශීලී ස්වරූපයක් ගනී. සමාජීය ප්‍රපංචයන් විශ්ලේෂණ කිරීමේදී මතු වන බොහෝ අඩු පාඩුකම් හා දුෂ්කරතාවන් ඇතිවීමට ප්‍රබලතම හේතුවක් වන්නේ මේ ගතික හා අවිනිශ්චිත එසේම බහු රේඛීයව සංවිධාන ව්‍යුහය ස්ථිරසාර ව්‍යුහයක් වශයෙන් විග්‍රහ කිරීම නිසාය.

මේ ක්‍රමවේදය මගින් බටහිර තේරුම් ගැනීම තුළින් ගෝලීය සමාජයේ ස්වභාවය අවබෝධකර ගත හැකිය. මක්නිසාද යත් බටහිර, ගෝලීය සමාජ සංවිධානයේ මූලිකම කොටස වන අතර බටහිර සංවිධානයක් වශයෙන් ගෝලීය සමාජයට නායකත්වය සපයන්නේය. මුළු මානව සංහතිය ම හසු කර ගන්නා වූ අදහස වියුක්ත අදහසක් නොව එය නිශ්චිත ඓතිහාසික හා සමාජ ආර්ථික කොන්දේසි තුළින් මතු වූ සංයුක්ත අදහසකි. මෙය යුරෝපීය අදහසක් වන අතර නමුත් මූලික වශයෙන් ඇමෙරිකානු අදහසකි. ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ ඇත්තේ යුරෝපා හා ඇමරිකානු වුවමනාවන් ය. තවදුරටත් ගෝලීය සමාජය යනු අදහසක් නොව එය යථාර්ථයකි. අද අපි සැම දෙනෙක්ම ගෝලීය සමාජයේ සාමාජිකයන් වෙමු. කෙසේ වුවද අප ජීවත් වන ලෝකය එතරම් විශාල නොවේ. දැනටමත් බටහිර විසින් එහි සිය ස්ථානය හිමිකරගෙන සිටින අතර එම ස්ථානය තව දුරටත් තහවුරු කර ගැනීම හා ව්‍යාප්ත කිරීම සඳහා බටහිර නිරන්තරව ක්‍රියාකරයි. බටහිර රටවල අද්‍යතන දේශපාලන, ආර්ථික හා සංස්කෘතික මතවාදී හා විද්‍යා තාක්ෂණික යුද ආරක්ෂක ප්‍රතිපත්තිය මුළුමනින්ම වාගේ සැකසී ඇත්තේ ඉහත ස්ථාවරය පදනම් කර ගෙනය. එකක් ස්ථිරව ම කිව හැකිය. එනම් අද බටහිර ගෝලීය සමාජයේ අත්පත් කර ගෙන ඇති ස්ථානය වෙන කිසිම කෙනෙකුට අත්පත් කර ගැනීමට ඉඩ නොදෙයි.

බටහිර නිශ්චිත සමාජ-ජීව නිර්මිතියක් වශයෙන් වටහා ගත යුතුය. ඒ අනුව බටහිර මානව සමාජයේ ඉතිහාසයෙහි මතු වූ ද්විතීක ප්‍රපංචයකි. අද අප ඉදිරියේ පවතින බටහිර සමාජය මෙන් ඊට සමාන මානව සමාජයක් මින් පෙර මානව ඉතිහාසයේ කිසිදා නොතිබිණි. අද අප පෘථිවියේ වෙසෙන දහස් ගණනක් ජාතීන්ගේ හා ජනවර්ගවල සම්ප්‍රදායික සමාජ ජීවන ව්‍යුහ වෙනස් කොට ඒවා බටහිරාසන්න, බටහිරවේෂී ආකාරයට ප්‍රතිනිර්මාණය කොට ගෝලීය සමාජ සංවිධානයට ඇතුළත් කර ගැනීමේ ඓතිහාසික හැකියාව ලත් එකම සමාජ - ජීව ව්‍යුහය වූයේ බටහිරය. මෙය බටහිරවාදය යන "අවබෝධය" හරහා තේරුම් ගත යුතුය.

බටහිරවාදය ගෝලීය සමාජයේ කේන්ද්‍රීය ලක්ෂණයයි. මේ අනුව බටහිරවාදය තේරුම් නොගෙන කිසිම ගෝලීය කරණයක් හෝ ගෝලීය සමාජයක් පිළිබඳව කතා කළ නොහැකිය. බටහිරවාදය යනු ඉතාම සංකීර්ණ සමාජ ප්‍රපංචයකි. බටහිරවාදයට ධනවාදය, ප්‍රජාතන්ත්‍රවාදය,



සමාජවාදය, කොමියුනිස්ට් වාදය, ෆැසිස්ට්වාදය, ලිබරල්වාදය හා තවත් බොහෝ සමාජීය ප්‍රපංචයන් ඇතුළත් වේ. නමුත් බටහිරවාදය සුවිශේෂ සමස්තයක් ලෙස සලකා බැලූ විට එය තව දුරටත් සම්පූර්ණයෙන්ම ධනවාදීවත් කොමියුනිස්ට්වාදීවත්, ප්‍රජාතන්ත්‍රවාදීවත් නොවේ. සමස්තයක් ලෙස ගෙන බලන විට බටහිර යනු යම් සුවිශේෂ ගුණයක් වඩා විශාල බටහිර රටවල් තුළින් මතු වූවකි. බටහිරවාදය එම රටවල් තුළ බිහි වූ අතර එම රටවල් පාදක කොට ගෙන වර්ධනය වෙයි. මේ අනුව බටහිර වාදය එය බිහි කළ මුල්, ප්‍රාථමික මව් රටවලට සාපේක්ෂව බලන විට බටහිර ද්විතීක සමාජ ප්‍රපංචයකි. නමුත් අද ඉන් තොරව බටහිර රටවලට අනාගතයක් පමණක් නොව පැවැත්මක් ද නැත. මෙම බටහිර සම්ප්‍රදායික රටවල් පාදක කොට ගෙන බිහිවී වර්ධනය වූ බටහිරවාදය අද වන විට එම සියලුම රටවල් තුළ ව්‍යාප්ත වී නොනැවතී මුලු පෘථිවි තලය පුරාම ද ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී යෑම කිසිම ලෙසකින්වත් වැළැක්විය නොහැකිය.

මෙහිදී තේරුම් ගත යුතු විශේෂ කාරණයක් වන්නේ ධනවාදය බටහිර වාදයට සම කිරීම වැරදි අදහසක් බවයි. ධනවාදය බිහි වීමට හා වර්ධනය වීමට ඉවහල් වූයේ, ද බටහිරයි. බටහිර ව්‍යුහයන් හැඩගැසීම සඳහා ධනවාදය විශේෂ කාර්යභාරයක් ඉටු කළ බව ඓතිහාසික සත්‍යයකි. නමුත් බටහිර වාදය මුළුමනින්ම ධනවාදයට සීමා කළ නොහැකිය. බටහිරවාදය මත බිහි වී වර්ධනය වූ ධනවාදය ක්‍රමානුකූලව මුලු සමාජය පුරාම ව්‍යාප්ත වී සිය අවසාන ලක්ෂය වන බටහිරවාදය වෙත ළඟා විය.

ලෝකයේ විවිධ මහද්වීපවල, කලාපවල, රටවල, ප්‍රදේශවල, නගරවල විසිරී හුදකලාව ජීවත් වන දශ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ වැඩ කටයුතු, ක්‍රියාකාරකම්, නිෂ්පාදනයේ හා විද්‍යාවේ, තාක්ෂණයේ, අධිවේගී සන්නිවේදන ක්‍රමවල වර්ධනය හේතු කොට ගෙන ඒකීය පොදු සමස්තයක් හැටියට ව්‍යුහගත කිරීම අද්‍යතන බටහිරවාදයේ මූලිකම කාර්යය වශයෙන් පවතියි.

ලෝක සමාජය, ගෝලීය සමාජය සමස්තයක් වශයෙන් ගත් කළ එහි සක්‍රීය කොටස වන්නේ දැනට බටහිර යුරෝපයේ රටවල් පාදක

කොට ගෙන ක්‍රියාත්මක වන බටහිර වාදයයි. එය ගෝලීය ක්‍රියාවලියේ කේන්ද්‍රීය ක්ෂේත්‍රයයි. මෙහි පරිවාරීය ක්ෂේත්‍රය හැටියට ලෝකයේ අනෙක් සියලුම රටවල් පිහිටා තිබේ.

මානව සංහතියේ ඉතිහාසය යනු මිනිසුන්, ජාතීන්, රටවල්, සංස්කෘතීන් හා ශිෂ්ටාචාරයන් සිය පැවැත්ම සඳහා එකිනෙකා අතර අඛණ්ඩව සිදු වන තියුණු, අරගලයකි. බටහිරවාදය සුවිශේෂ සමාජ, දේශපාලන සංවිධාන ව්‍යුහයක් ලෙස බිහිවී මුළු ලෝකය පුරාම ව්‍යාප්ත වීම නිසා සෙසු ජාතික, සංස්කෘතික, සමාජ, දේශපාලනික පද්ධති අභාවයට ගියේය. යුරෝපා සමාජයේ පරිණාමයේ ඉතිහාසය දෙස බලන විට එක් කරුණක් ඉතා පැහැදිලිය. බටහිර රටවල මුළු විමුක්තිකාමී, නිදහස්කාමී හා ශිෂ්ටාචාරී ක්‍රියාකාරීත්වය මුළු ඉතිහාසය පුරාම එක් පරමාර්ථයක් පෙරදැරි කර ගෙන සිදු විය. එය මුළු ලෝකයම තමන් අතට පත් කර ගැනීමේ පරමාර්ථයයි. ඒ අනුව බටහිර රටවල් වෙනත් රටවල් හා ජාතීන් සමග සම්බන්ධ කරන විජිතකරණය, නව යටත්විජිතවාදය, අධිරාජ්‍යවාදය, ප්‍රජාතන්ත්‍රවාදය, මානව අයිතිවාසිකම් පිළිබඳ මානවාදය, ගෝලීයවාදය යන සංසිද්ධීන් බටහිර හා ලෝක ඉතිහාසයේ පරිණාමයේ අවධීන් සමග තාර්කිකව එකිනෙකට සම්බන්ධව පවතී. මේ සෑම අවධියකදීම ලෝක ව්‍යුහය හැඩගැසී ක්‍රියාත්මක වූයේ බටහිරට වාසි වන අන්දමටය.

බටහිරවාදය තුළ ප්‍රාග්ධනය සුවිශේෂ කාර්යභාරයක් ඉටු කරන්නේය. බටහිරවාදයේ සමකාලීන ස්වරූපය තුළ නිෂ්පාදන ප්‍රාග්ධනය ගෝලීයකරණය වීම සුවිශේෂ ලක්ෂණයකි. මෙය ලෝක ප්‍රාග්ධන සංචලනයේ ඉතිහාසයෙහි නොවූ වෙනස් තත්ත්වයකි. ලෝක ආර්ථිකයේ ගෝලීයකරණය යටතේ සිදුවන්නේ හුදෙක් දේශ සීමා හරහා භාණ්ඩ වෙළඳාම හෝ මූල්‍ය ප්‍රාග්ධනය ආයාත නිර්යාත කිරීම නොවේ. ඉහත අප විස්තර කරන ලද ද්විතීක ව්‍යුහයන් මගින් ජාතික සීමා හරහා ආර්ථික කටයුතු මාලාවක් සම්බන්ධීකරණය කිරීමයි, පාලනය කිරීමයි, හැසිරවීමයි. මෙහිදී සිදු වන්නේ පෘථිවි තලය පුරා විසිරී පැතිරී ඇති ආර්ථික කටයුතු ඒකීය සමස්තයක් වශයෙන් ඒකාග්‍ර කොට නියාමනය කිරීමයි.



මේ අනුව ගෝලීය සමාජය යනු පවතින ලෝකයේ රටවලට සම්බන්ධව, එම රටවල් පාදක කොට ගෙන ගුණාත්මක වශයෙන් වඩා උසස් ද්විතීක නවතම සමාජීය ව්‍යුහයන් හරහා මුළු ලෝකය පුරාම විසිරී ඇති ආර්ථික, සමාජයීය, දේශපාලනික, සංස්කෘතික දෘෂ්ටිමය ආදී මානව ක්‍රියාකාරීත්වයේ සියලුම ක්ෂේත්‍ර ධුරාවලී ව්‍යුහගත ඒකීය සමස්ත ජාලයක් හැටියට සම්බන්ධීකරණය කොට නියාමනය කිරීමයි.

බටහිර රටවල ජීවන අවශ්‍යතාවන් නිසා බිහි වූ මේ ගෝලීය ලෝක ව්‍යුහය වර්තමානයේ දී ඉතාම සූක්ෂමව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක වේ. අද මෙය පරිවාරයේ ජාතික රාජ්‍යයන් තුළ ආර්ථික, දේශපාලන, සංස්කෘතික හා මතවාදී ක්ෂේත්‍රවල තියුණු අර්බුද ඇති කිරීමට තුඩු දී ඇත. මේ ගෝලීය ව්‍යුහයන්ගේ බලපෑම නිසා සමහර ඒකීය රටවල් කොටස්වලට කැඩී වෙන් වී යන අතර සමහර රටවල් ඒකාබද්ධ වන්නේය. මේ ගෝලීය සමාජ ධුරාවලියේ ඉහළ ව්‍යුහයන් එහි පහළ ව්‍යුහයන් කෙරෙහි සෘජුව හෝ වක්‍රියව බලපාන අතර එම බලපෑම් විවිධ ආකාරයට විවිධ මට්ටමින් විවිධ ශෛලියෙන් විවිධ ක්ෂේත්‍ර කෙරෙහි සිදු වේ. සමස්තයක් වශයෙන් බලන විට පෙනෙන්නේ ලෝකයේ ඕනෑම රටක සිදු වන සැලකිය යුතු සිදුවීමක් පිළිබඳව ගෝලීය ව්‍යුහයන්ගේ යම් කිසි සම්බන්ධයක් හෝ මැදිහත්වීමක් දක්නට ලැබෙන බවයි. මේ සෑම කටයුත්තක් සම්බන්ධවම ගෝලීය ව්‍යුහයන්ට යම් කිසි හෝ කාර්යයක් ඉටු කිරීමට තිබෙන බව හැඟීයන්නේය.

මේ අනුව බලන විට පෙනී යන ප්‍රධාන කාරණාවක් වන්නේ බටහිර දනට ලෝකයේ දරන ස්ථානයත්, තත්ත්වයත්, මෙතෙක් ලබා ඇති ජයග්‍රහණත්, තර්ජනාත්මක හා සංකීර්ණ කොන්දේසි තුළ ආරක්ෂා කර ගැනීමට ප්‍රයත්න දැරීම, සෘජු ලෙසම ලෝක අර්බුදය විශේෂයෙන්ම පරිවාරයේ රටවල අර්බුද උත්සන්න කිරීමට බලපාන්නේය.

බටහිර මුළු ඉතිහාසය පුරාම කළේ ලෝකය තමන්ගේ වුවමනාවන් වලට ගැළපෙන ආකාරයට සකස් කර ගැනීමයි. මෙය විවිධ ඓතිහාසික යුගවලදී බටහිර විවිධ ප්‍රමාණයෙන් කළ අතර අද එය ගෝලීයකරණ ස්වරූපය තුළ අවසාන ලක්ෂය කරා පැමිණ තිබේ. මේ අනුව

බටහිරවාදය නැමැති විශේෂ සමාජ සංවිධාන ක්‍රමය නිශ්චිත ඓතිහාසික තත්ත්වයන් තුළ ඇති වූවා පමණක් නොව එහි පසුකාලීන වර්ධනය මුළු පෘථිවියේ ම මුහුණුවර වෙනස් කිරීමට සමත්විය.

ඓතිහාසික වශයෙන් බටහිර රටවල් ජාතික රාජ්‍යයන් තුළ හැඩගැසී වර්ධනය වූයේ සමාජ සංවිධාන ව්‍යුහයන් වශයෙනි. මානව සංහතියේ සෙසු ජාතීන්ගේ සමාජ සංවිධාන ව්‍යුහයන්වලට සාපේක්ෂව, බටහිර සමාජ සංවිධාන ව්‍යුහයන් උසස් මට්ටමක් හා කාර්යක්ෂමතාවක්ද ඉසිලීය. එය හරියටම සෙසු මානව සංහතිය මත ස්ථාපිත වූ උපරිව්‍යුහයන් බඳුය. බටහිර රටවල් මානව සංහතිය මත සිය ආධිපත්‍යවාදය පවත්වාගෙන යාම සඳහා සිය ශක්තිය, හැකියාව හා ශක්‍යතාවන් වර්ධනය කළේය. ඔවුන් එය කොතෙක් දුරට වර්ධනය කළේද යත් මුළු පෘථිවි තලයේ ම ජීවත් වන සියලුම ජනතාවන්ගේ ඉරණම ඔවුන්ගේ අතට ගැනීම දක්වා එය වර්ධනය කළේය. එනම් මුළු පෘථිවි තලයේම පවතින සියලුම රටවල් හා ජනතාවන් එකම ගෝලී ධූරාවලියකට හසුකර ගත්තේය. මෙම ගෝලීය ධූරාවලිය සෑම විටම ක්‍රියාත්මක වන්නේ බටහිරට වාසි වන අන්දමටය. ගෝලීය සමාජයේ යථා ස්වභාවය මෙය වන්නේය.